"මන්ද මානසික තරුණියට බාසුන්නැහේ අමුතු වැඩක් කරලා" යනුවෙන් සිරස්තලයක් සමගින් පුවතක් දිවයින පුවත්පතෙන් (04/06) ඉදිරිපත් වී ඇත. කෙසේ වෙතත් පුවත් අන්තර්ගතයේ දැක්වෙන්නේ මෙය ලිංගික අපරාධයක් බවයි. එසේ නම් නීතිය ඉදිරියේ බරපතල වරදක් ලෙසින් ගැනෙනා ලිංගික අපරාධයක්, සිරස්තලය තුළ "අමුතු වැඩක්" වී ඇත්තේ මන්ද? මේ ඔස්සේ සිදුවන්නේ අපරාධයේ බරපතලකම ලඝු කොට දැක්වීමක් නොවේද? එය කෙතරම් ආචාර ධර්මයන්ට අනුකූල වන්නේද?

එසේම, "දූෂණය" යන යෙදුමෙන් වින්දිතයා අපවිත්‍ර වී ඇති බවක් ගම්‍ය කෙරේ. එනිසා ඒ වෙනුවට මෙතැනදී වඩාත් යෝග්‍ය වන්නේ "ලිංගික අපරාධය" යන්නයි.
#MediaEthicsSL #lka #SinhalaPress #Divaina